රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 317

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 දෙසැම්බර් මස 10 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ප්‍රතිශෝධිත ආයතන සංග්‍රහය I වන කාණ්ඩය (ඉංග්‍රීසි)

ප්‍රතිශෝධිත ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩය - ඉංග්‍රීසි (සූචිය සහිතව) රජයේ මුද්‍රණාලයාධිපති ලඟදීම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත සපයනවා ඇත. සංශෝධිත පත්‍රිකා/චක්‍රලේඛ මගින් 1985 අගෝස්තු 31 වන දින දක්වා කරන ලද සියලුම සංශෝධනයන් ඊට ඇතුලත් ය.

02. ප්‍රතිශෝධිත සංග්‍රහයේ I වන කාණ්ඩයෙහි පරිච්ඡේද I සිට XXXIII දක්වා අනුක්‍රමිකව අංක කර ඇත. පැරණි සංග්‍රහයෙහි සමහර පරිච්ඡේද ඒකාබද්ධ කර ඇත. ප්‍රතිශෝධිත සංග්‍රහයෙහි එක් එක් පරිච්ඡේදයේ ශීර්ෂය සහ අංකය ද දැනට පවත්නා සංග්‍රහයෙහි ඊට අනුරූපිත පරිච්ඡේද අංකය ද පහත සඳහන් පරිදි වේ:-

| ශීර්ෂය | පරිච්ඡේද අංකය | |
|---|---|---|
| | ප්‍රතිශෝධිත සංග්‍රහය | පැරණි සංග්‍රහය |
| සාමාන්‍ය | 1 | 1 |
| සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය සහ පත්කිරීම් | 11 | 11 |
| මාරුකිරීම් | 111 | 111 |
| මාස් පඩි, තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රධානය කිරීම | 1V | 1V |
| සේවයෙන් මුදාහැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම | V | V |
| සේවා ලේඛන, චාරිත්‍ර හා සහතික | V1 | V1 |
| වැටුප් | V11 | V11 |

2.../

| | | |
|---|---|---|
| අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා පඩි සහ දීමනා | V111 | V111 & |
| ගාස්තු | 1X | 1X |
| ජූරි සභිකයින්ට, සාක්ෂිකරුවන්ට, නිදු නොලත් මහේස්ත්‍රාත්වරුන්ට, පරීක්ෂකයින්ට සහ විවිධ සේවා වෙනුවෙන් කරනු ලබන ගෙවීම් | X | XLV1 |
| ප්‍රතිපූරණ සහ වන්දි ගෙවීම් | X1 | XX1X & XXX |
| නිවාඩු | X11 | X11 |
| දුම්රිය බලපත්‍ර | X111 | X111 |
| දිවයින ඇතුළත රාජකාරී ගමන් | X1V | X1V |
| අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා පිටරට යෑම | XV | XV |
| නිවාඩු ගමන් | XV1 | XV11 |
| අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර | XV11 | XXV11 |
| නිල නිවාස | XV111 | XV111 |
| ආණ්ඩුවේ නිවාස | X1X | X1X |
| නිවාඩු බංගලා | XX | XX |
| ආරක්ෂක ඇඳුම් සහ නිල ඇඳුම් | XX1 | XX11 |
| සුභ සාධක පහසුකම් | XX11 | XX111 |
| ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ හා ඒ පිළිබඳ කොන්දේසි | XX111 | XX1V |
| වැටුප් ණය/අත්තිකාරම් | XX1V | XXV |
| වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ | XXV | XX1 |
| වෛද්‍ය උපචාරය සහ නිලධාරීන්ගේ කායික යෝග්‍යතාව පිළිබඳ වෛද්‍ය පරීක්ෂණය | XXV1 | XXV111 & XL1 |
| ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග | XXV11 | XXXV111 |

| | | |
|---|---|---|
| පරිපාලන කාර්ය පරිපාටිය | XXV111 | XXX1X |
| ඉඩම් අත්කර ගැනීම, ආයෝජන හා උකස් | XX1X | XXX111 |
| ආණ්ඩුවේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල | XXX | XV1 |
| සමිති සමාගම් පවත්වාගෙන යාම සහ අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ අයිතිවාසිකම් භුක්ති විඳීම | XXX1 | XXXV |
| දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම | XXX11 | XXXV1 |
| නීති උපදෙස් සහ නඩු | XXX111 | XL111 & XL1V |

03. ආයතන සංග්‍රහයට කරන සංශෝධන පිළිබඳව I වැනි පරිච්ඡේදයේ 2 වැනි වගන්තියෙහි සඳහන් වෙයි. මුද්‍රිත සංශෝධනය ඔබ වෙත ලැබෙන්නේ, සංශෝධන දක්වන චක්‍රලේඛය ලැබී සෑහෙන කලෙකට පසුව වන හෙයින්, එවැනි චක්‍රලේඛයක් ලත් විට, චක්‍රලේඛ ගොනුව යාවත් කාලීන කරනවා හැර, සංග්‍රහය සංශෝධනය කරන චක්‍රලේඛයේ අංකය සහ දිනය නව සංග්‍රහයෙහි නියමිත ස්ථානයේ සටහන් කර තබා ගැනීමටද ක්‍රියා කිරීම මැනවි.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

තු/-